# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1819/3 - 2013 ජූලි මස 15 වැනි සඳුදා - 2013.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (සංශෝධිත)**

3(4) වැනි උපවගන්තිය යටතේ වූ නිවේදනය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ (සංශෝධිත) 3(4) වැනි උපවගන්තිය යටතේ, මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන වන මා විසින්, මෙම නිවේදනය මගින්-

(1) ඉහත කී පනතේ කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගෙන ඇති නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ සාම්පූර් ප්‍රදේශයේ මහා පරිමාන බැර කර්මාන්ත මෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිත වෙනත් ව්‍යාපෘති පිහිටුවීම සඳහා වූ විශේෂ කලාපයක් පිහිටුවා එය සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම සහ කළමණාකරණය කිරීම සඳහා අනුමත කරනු ලැබ ඇති මෙකී ආයෝජන ව්‍යාපෘතිය මගින් සහ වෙනත් ඉලක්ක කරගනු ලබන ආයෝජකයින් විසින් මෙකී කලාපය තුළ ස්ථාපිත කරනු ලබන ආයෝජන තුළින් උපයාගැනීමට බලාපොරොත්තු වන්නාවූ ඇමරිකානු ඩොලර් මිලියන හාරදහසක (US$ 4,000 මිලියන) අපේක්ෂිත ආයෝජනයක් සහිත පිහිටුවනු ලැබ ඇති මෙම ව්‍යාපෘතිය පෙරදක්නු ආයෝජකයින් සඳහා අවශ්‍ය වන භෞතික මෙන්ම සමාජීයය යටිතල පහසුකම්, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් නවීන අංගෝපාංග සහිත විනෝදාත්මක පහසුකම්, ගැඹුරු මුහුදේ ජැටියක් ඉදිකිරීම සහ පර්යන්ත පහසුකම් සංවර්ධනය කිරීම, ගල් අඟුරු ගබඩා කිරීම සඳහා අංගනයක් ඉදිකිරීම සහ එම පහසුකම් වලට අමතරව මෙම කලාපය තුළ අභ්‍යන්තර පාරවල්, විදුලිබල සැපයුම, මළ අපද්‍රව්‍ය සහ ජල ප්‍රතිවහන පද්ධතියක් ඉදිකිරීම ආදිය මෙම ව්‍යාපෘතිය මගින් කරනු ලබන අතර ඉහත කී පනතේ අවශ්‍යතාවයන් සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හැඳින්වෙන දැන්වීම 2013.02.06 වැනි දින අංක 1796/9 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රිකාවේ* පළකරන ලද බවත්,

(2) නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ, සාම්පූර් ප්‍රදේශයේ මහා පරිමාන බැර කර්මාන්ත මෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිත වෙනත් ව්‍යාපෘති පිහිටුවීම සඳහා වූ විශේෂ කලාපයක් පිහිටුවා එය සංවර්ධන කර ක්‍රියාත්මත කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අනුමත කරනු ලැබ ඇති මෙකී ආයෝජන ව්‍යාපෘතිය මගින් සහ වෙනත් ඉලක්ක කරගනු ලබන ආයෝජකයින් විසින් මෙකී කලාපය තුළ ස්ථාපිත කරනු ලබන ආයෝජන තුළින් උපයා ගැනීමට බලාපොරොත්තු වන්නාවූ ඇමරිකානු ඩොලර් මිලියන හාරදහසක (US$ 4,000 මිලියන) අපේක්ෂිත ආයෝජනයක් සහිත පිහිටුවනු ලැබ ඇති මෙම ව්‍යාපෘතිය පෙරදක්නු ආයෝජකයින් සඳහා අවශ්‍ය වන භෞතික මෙන්ම සමාජීයය යටිතල පහසුකම්, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් නවීන අංගෝපාංග සහිත විනෝදාත්මක පහසුකම්, ගැඹුරු මුහුදේ ජැටියක් ඉදිකිරීම සහ පර්යන්ත පහසුකම් සංවර්ධනය කිරීම, ගල් අඟුරු ගබඩා කිරීම සඳහා අංගනයක් ඉදිකිරීම සහ එම පහසුකම් වලට අමතරව මෙම කාලපය තුළ අභ්‍යන්තර පාරවල්, විදුලිබල සැපයුම, මළ අපද්‍රව්‍ය සහ ජල ප්‍රතිවහන පද්ධතියක් ඉදිකිරීම,

ආදිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ඉහත කී පනතේ අවශ්‍යතාවයන් සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා 3 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය අනුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගන්නා ලද බවත් ;

(3) "නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ, සාම්පූර් ප්‍රදේශයේ මහා පරිමාන බැර කර්මාන්ත මෙන්ම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය සහිත වෙනත් ව්‍යාපෘති පිහිටුවීම සඳහා වූ විශේෂ කලාපයක් පිහිටුවා එය සංවර්ධන කර ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අනුමත කරනු ලැබ ඇති මෙකී ආයෝජන ව්‍යාපෘතිය මගින් සහ වෙනත් ඉලක්ක කරගනු ලබන ආයෝජකයින් විසින් මෙකී කලාපය තුළ ස්ථාපිත කරනු ලබන අයෝජන තුළින් උපයා ගැනීමට බලාපොරොත්තු වන්නාවූ ඇමරිකානු ඩොලර් මිලියන හාරදහසක (US$ 4,000 මිලියන) අපේක්ෂිත ආයෝජනයක් සහිත පිහිටුවනු ලැබ ඇති මෙම ව්‍යාපෘතිය පෙරදක්නු ආයෝජකයින් සඳහා අවශ්‍ය වන භෞතික මෙන්ම සමාජීයය යටිතල පහසුකම්, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් නවීන අංගෝපාංග සහිත විනෝදාත්මක පහසුකම්, ගැඹුරු මුහුදේ ජැටියක් ඉදිකිරීම සහ පර්යන්ත පහසුකම් සංවර්ධනය කිරීම, ගල් අඟුරු ගබඩා කිරීම සඳහා අංගනයක් ඉදිකිරීම සහ එම පහසුකම් වලට අමතරව මෙම කාලපය තුළ අභ්‍යන්තර පාරවල්, විදුලිබල සැපයුම, මළ අපද්‍රව්‍ය සහ ජල ප්‍රතිවහන පද්ධතියක් ඉදිකිරීම ආදිය සාම්පූර් හි ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය" ලෙස ඉහත කී ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතිය නම්කර හඳුන්වන අතර ව්‍යාපෘති සමාගම සීමාසහිත ශ්‍රී ලංකා ගේට්වේ (පුද්ගලික) සමාගම එකී ව්‍යාපෘති සමාගම වන බවත් ;

(4) 2012 ජුනි මස 13 වැනි දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ අත්සන් තබන ලද ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් සහ අර්ථ නිරූපනය කරන ලද ක්‍රියාකාරී දිනය සිට වසර හතක් (07) ඇතුළත ඉහත කී ව්‍යාපෘතිය එහි වාණිජ්‍ය කටයුතු ආරම්භ කළයුතු බවත් ; සහ

(5) මෙම නියෝගය උපලේඛණයේ විශේෂණය කරන ලද නීතිවලින් නිදහස් කිරීම එහි නිශ්චිතව සඳහන්කර තිබෙන්නාවූ සීමාවන්වලට යටත්ව ව්‍යාපෘති සමාගමට අදාළ වනු ඇත.

### උපලේඛනය

(අ) *2006 අංක 10 දරන දේශීය ආදායම් පනත (සංශෝධිත)*

-වසර විසිපහක (25) කාලසීමාවක් සඳහා ව්‍යාපෘති සමාගම බදු ගෙවිය යුතු ලාභය දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන වලින් නිදහස් වේ. ("බදු නිදහස් කාලය"). එකී වසර විසිපහක (25) ක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන්මතු වසරකට (01) ලාභවලින් කොටස්කරුවන් ට බෙදා දෙනු ලබන ලාභාංශ වලට ආදායම් බදු නිදහස ලැබේ.

-එකී බදු නිදහස් කාලය ව්‍යාපෘති සමාගම ලාභ උපයන මුල් වසරේ ආරම්භයේ සිට හෝ වාණිජ්‍ය කටයුතු ආරම්භ කිරීමෙන් වසර දෙකකට (02) පසු, යන දෙකින් කලින් එළඹෙන දින සිට ආරම්භ වේ.

-ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගත් විදේශ ණය සඳහා ගෙවන ලද පොළිය සහ ව්‍යාපෘතිය මඟින් සේවයේ යොදවනු ලබන උපදේශකයින්ට ගෙවනු ලබන තාක්ෂණික ගාස්තු මත රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් සමාගම නිදහස් කරනු ලැබේ.

-ඉහත විදහා පෙන්වා දී තිබෙන බදු නිදහස් කාල සීමාව සහ සහනකාරී බදු කාලසීමාව ඉකුත් වීමෙන් පසුව දේශීය ආදායම් පනතේ විධිවිධාන අනුව එවිට බලපවත්වන සාමාන්‍ය බදු රාමුව ව්‍යාපෘති සමාගම කෙරෙහි අදාල වනු ඇත.

-සේවකයින් විස්ස (20) දෙනෙකුගේ උපරිමයකට යටත්ව සමාගමේ ප්‍රවාසික සේවකයන් සම්බන්ධයෙන් උපයන විට ගෙවිය යුතු බදු ගෙවීමෙන් නිදහස් වේ. මෙම බදු නිදහස ව්‍යාපෘතිය වාණිජමය කටයුතු ඇරඹීමේ දින සිට පස් (5) වසරක කාලයක් සඳහා වලංගු වනු ඇත.

(ආ) *2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත (සංශෝධිත)*

-ගිවිසගත් දිනයේ සිට ව්‍යාපෘතිය ඉදිකිරීම් කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයනය කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිළදී ගනු ලබන භාණ්ඩ සහ සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීම නිදහස් කරනු ලැබේ. මෙම භාණ්ඩ සහ සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීම නිදහස් කිරීම ව්‍යාපෘතියේ ඍජු සැපයුම්වලට පමණක් නොව ව්‍යාපෘති සමාගම විසින් අනුමත කොන්ත්‍රාත්කරුවන් වෙනුවෙන් සැපයුම් සලසන උප කොන්ත්‍රාත්කරුවන් විසින් සිදුකරන සැපයුම් සඳහා ද අදාල වේ.

-ව්‍යාපෘති සමාගම විසින් සේවාවන් මත ලබාගත් ආදායම ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් අදියර 1 යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ පසු හෝ ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් බලාත්මක වන දිනයේ සිට අවුරුදු තුනක (3) කාලය යන දෙකින් කවර හෝ අඩු කාල පරිච්චේදය තුළ ශුන්‍ය අනුපාතියකට ප්‍රමිත කරනු ලැබේ.

උපලේඛනය (සම්බන්ධිතයි )

-ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් අදියර 1, 2, 3 යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් පසුව හෝ ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් බලාත්මක දිනයේ සිට අවුරුදු හතක (7) කාලය යන දෙකින් කවර හෝ අඩු කාල පරිච්ඡේදය තුළ එකතු කල අගය මත බදු පනතේ 7 වැනි කොටසේ උප වගන්ති (1) හි (ආ) හෝ (ඇ) ඡේදයන් වල විධිවිධාන යටතේ ලබා දුන් සේවාවන් ඇතුළත් වන විට එකතු කළ අගය මත බදු ගෙවීම ශුන්‍ය අනුපාතිකයට ප්‍රමිත කරනු ලැබේ. ශුන්‍ය අනුපාතිකයට ප්‍රමිත කරනු ලබන සේවාවන් හැර සෙසු සේවාවන් මත සාමාන්‍ය පරිදි එකතු කල අගය මත බදු ගෙවීම අදාල වනු ඇත.

(ඇ) *2011 අංක 18 දරන වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන අයකිරීම් පනත (සංශෝධිත)*

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආනයනය කරනු ලබන සියලුම ද්‍රව්‍යයන් ඉහත පනත යටතේ ගෙවනු ලබන අයකිරීම් වලින් අවුරුදු හතක (7) කාලයක් සඳහා නිදහස් වේ.

(ඈ) *2009 අංක 9 දරන ජාතිය ගොඩනැංවීමේ බදු පනත (සංශෝධිත)*

ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය වන ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් බලාත්මක දිනයෙහි සිට වසර හතක (7)ක කාලයක් සඳහා අදාල නොවනු ඇත.

(ඉ) *2005 අංක 05 දරන මුදල් පනත*

ව්‍යාපෘතිය ඉදිකිරීමේ කාලය වන ව්‍යාපෘති ගිවිසුමේ සඳහන් බලාත්මක දිනයෙහි සිට අවුරුදු හතක (7) කාලය ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් අයකිරීම සහ ගෙවීම් අදාල නොවනු ඇත.

(ඊ) *(235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත*

ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් වලට අනන්‍ය වශයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම නමින් හෝ කොන්ත්‍රාත්කරුවන් හෝ උප කොන්ත්‍රාත්කරුවන් ආනයනය කරනු ලබන සියලු ප්‍රාග්ධන භාණ්ඩ සහ ඉදිකිරීම් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් ව්‍යාපෘතිය ගිවිසුමේ සඳහන් බලාත්මක දිනයේ සිට අවුරුදු හතක (7) කාලය තුළ රේගු බදු අයකිරීම් වලින් නිදහස් කිරීම අදාල වේ.

ලක්ෂ්මන් යාපා අබේවර්ධන, පා. ම.,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 11 වැනි දින,
කොළඹ දී ය.

08-16

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.